# පැරණි ලක්දිව නීති ක්‍රමය සකස්වීම කෙරෙහි පෙර සිරිතේ සහ බුදුදහමේ බලපෑම

පී. මංජුලා උදයකුමාරි[1]

## හැඳින්වීම

රටක සදාචාරය, යහපැවැත්ම පවත්වාගනු වස් නීතිය අත්‍යවශ්‍ය වේ. ලාංකේය දේශපාලන සන්දර්භය තුළට "නීතිය" නමැති සංකල්පය ප්‍රවේශ වූයේ යුරෝපීයයන්ගේ ආගමනයෙන් පසු ව යැයි ඇතමුන්ගේ මතය යි. නමුත් මෙම මතය සාවද්‍ය වූවක් බව කරුණු විමසීමේදී පැහැදිලි ව පෙනේ. මෙවන් දුර්මතයක් ඇතිවන්නට ඇත්තේ පැරණි ලක්දිව පැවති නෛතික තත්ත්වය සම්බන්ධයෙන් නීති සාහිත්‍යයක් දක්නට නොමැති නිසා වන්නට ඇත. එවැනි නීති සාහිත්‍යයක් දක්නට නොමැත්තේ ඇතැම්විට වරින්වර මෙරටට එල්ල වූ පරසතුරු ආක්‍රමණයන් නිසා එවැනි ග්‍රන්ථ විනාශ වූ නිසා විය හැකි ය. නමුත් යම් ආකාරයක නීති පද්ධතියක් පැරණි ලංකාවේ පැවති බවට සාධක සාහිත්‍යමය මූලාශ්‍රයන්ගෙන් මෙන් ම පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන්ගෙන් ද ලැබේ. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ එම ලැබෙන සාධකයන්ට අනුව පැරණි ලක්දිව නීති ක්‍රමය පෙර සිරිතට අනුව සහ බුදුදහමට අනුව හැඩගැසුණු එකක් ද යන්නත් එම නීති ක්‍රමය සාධාරණ වූවක් වීමට පෙර සිරිත සහ බුදුදහම පිටිවහලක් වූයේ ද යන්නත් අධ්‍යයනය කිරීම යි.

## මූලාශ්‍රය

ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය යොදාගන්නා ලදී. අභිලේඛන කෙරෙහි විශේෂ අවධානය යොමුකළ අතර ඒ හැරුණුවිට මහාවංසය, දීපවංසය ආදී ප්‍රාථමික සාහිත්‍යමය මූලාශ්‍රය කෙරෙහිත් පැරණි නීතිය සම්බන්ධයෙන් ලියවී ඇති ද්විතීයික මූලාශ්‍රය කෙරෙහිත් අවධානය යොමු කරන ලදී.

## අධ්‍යයන ක්‍රමවේදය

මෙහිදී අධ්‍යයන ක්‍රමවේදය වූයේ ප්‍රාථමික මූලාශ්‍රය හා ද්වීතීයික මූලාශ්‍රය විමර්ශනය කරමින් නිරවද්‍ය දත්ත රැස් කිරීම යි. විශේෂයෙන් ම මෙහිදී ශිලාලේඛනවලින් අනාවරණය වන තොරතුරු කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලදී.

---

1 සහකාර කථිකාචාර්ය, ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, manjuhis88@gmail.com

## ප්‍රතිඵල

මෙම අධ්‍යයනය තුළින් ලැබුණු ප්‍රතිඵලය වූයේ පැරණි ලක්දිව නීතිය සකස්වීම කෙරෙහි පෙර සිරිත මෙන් ම බුදුදහමත් එකලෙස බලපෑ බව අනාවරණය කරගත හැකි වීම යි.

## විස්තෘත සාරසංක්ෂේපය

නීතිය සම්බන්ධයෙන් ලියවී ඇති ප්‍රාථමික මූලාශ්‍රයක් වන නීති නිඝණ්ඩුවේ නීතිය අර්ථකථනය කොට ඇත්තේ,

"පොරාණ රාජූහි පඤ්ඤත්තධම්මං න සමුච්ඡින්දියන්ති ති නීති : නී පාපුනනෙ"

වශයෙනි. එනම්, පළමු රජ දරුවන් විසින් නියම කරන ලද ව්‍යවහාර යුක්ති කඩ නොකොට ඒ ආකාරයෙන් ම පැවැත්වීම නීතිය නම් වන බව යි. ඒ අනුව අතීතයේ සිට අඛණ්ඩ ව පැවත ආ පෞරාණික ප්‍රතිපත්තීන් පෙර සිරිත් යන්නෙන් අදහස් කරන බව පැවසීම උචිත ය. සැබැවින් ම පැරණි ශ්‍රී ලංකාවේ පෙර සිරිත හා නීතිය අතර විශාල පරතරයක් නොවූ තරම් ය. ඒ අනුව කාලයක් පුරා රටේ මුල් බැසගෙන පැවති චාරිත්‍ර රටේ නීතිය බවට පත්වන්නට ඇතැයි සිතීම යුක්ති සහගත වේ. කෞටිල්‍ය සඳහන් කරන්නේ ධර්ම, ව්‍යවහාර, චාරිත්‍ර හා රාජාඥාව අතුරින් රාජාඥාව වඩා බලවත් නීති මූලය බව යි. නමුත් පැරණි ශ්‍රී ලංකාවේ රාජාඥාවටත් වඩා බලවත් වූයේ චාරිත්‍රය යි. එනම් රාජාඥාව මත නව නීති පැනවුව ද, පැවති නීති වෙනස් කළ ද රජු හැකි සෑම විටෙක ම පාහේ පූර්ව චාරිත්‍රය ඉක්මවා නොයාමට වගබලා ගත්තේ ය. මෙම නීතිය මහනුවර යුගය දක්වාත් අවිච්ඡින්න ව පැවති බව මූලාශ්‍රයෙන් පැහැදිලි ව පෙනේ.

පෙර සිරිත් ආරක්ෂා කිරීම රජවරුන්ගේ අනිවාර්ය යුතුකමක් වූ අතර එය මෙරට පාලනය කළ විජාතික රජවරුන්ට ද පොදු කාරණයක් වූ බව මූලාශ්‍රය විමසීමේදී පෙනී යයි. විශේෂයෙන් ම පෙර සිරිත් කඩ කළ රජවරුන්ට විරුද්ධ ව ජනතා විරෝධයන් පවා පැන නැගුණු අතර එවැනි රජවරුන්ට නැවත ජනතාවගේ ප්‍රසාදය ලබා ගැනීම සඳහා පූර්ව චාරිත්‍ර කඩ නොකරන බවට ප්‍රතිඥා දීමට පවා සිදුවූ බව මූලාශ්‍රය විමසීමේදී පෙනේ. රජුට වුව නීතිය ඉදිරියේ හිස නැමීමට සිදුවූ හෙයින් රජු පැරණි ලංකාවේ නීතියේ උල්පත ලෙස නොසැලකේ ය.

පෙර සිරිතට අනුව හැඩගැසුණු පැරණි ලක්දිව නීති ක්‍රමය වඩ වඩාත් සාධාරණ වීම කෙරෙහි බුදුදහම තදින් ම බලපෑ බව කිව හැකි ය. කිසියම් රටක නීතිය සකස්වීම කෙරෙහි ආගම බෙහෙවින් ම බලපාන බව කීම අතිශයෝක්තියක් නොවේ. භාරතයේ නීතිය සකස්වීම කෙරෙහි හින්දු ආගම බලපා ඇති අතර ලංකාවේ නීතිය සකස්වීම කෙරෙහි බුදුදහම බලපෑවේ ය. ලාංකේය රජවරු බොහෝ අවස්ථාවන්හි රාජ්‍ය පාලනයේදී සංඝයාගේ අනුශාසකත්වය පැතූ හෙයින් එතුළින් ද ඔවුන්ට සන්නිවේදනය වූයේ බුදුදහම යි. එසේ ම ඇතැම් ආරාවුල්

අවස්ථාවන්හි ඊට මැදිහත් වී ගිහි පැවිදි දෙපක්ෂයේ ම විනිශ්චයකරුවන් ලෙස භික්ෂූහු කටයුතු කළහ.

බුදුදහමේ ඉගැන්වෙන අවිහිංසා ප්‍රතිපත්තිය මුල්කොට ගත් මාඝාත ආඥාව රජවරුන් කිහිප දෙනෙකු ම ක්‍රියාත්මක කළ බවට සාධක තිබේ. පොහොය දිනයන්හි මත්ස්‍ය මාංශ සහ සුරා ආදිය තමන්ගේ ඇතුළු නුවරට ගෙන ඒම වැළැක්වීම, වැව්වල මාලු ඇල්ලීම පවා නීතියෙන් තහනම් කිරීම වැනි ව්‍යවස්ථා එකල පැවති බව මූලාශ්‍රය විමසීමේදී අනාවරණය වේ.

යම් නීතියක් බලාත්මක වීමට නම් නියමිත දඬුවමක් ලබා දීමත් අත්‍යවශ්‍ය වේ. එහෙයින් වරදට සුදුසු දඬුවම් ක්‍රියාත්මක කළ ද එසේ කළේ පලිගැනීමේ චේතනාවෙන් නොව, වරදකරුවන් යහමගට ගැනීමේ අරමුණෙනි. එසේ ම දඬුවම් ක්‍රියාත්මක කිරීමට පෙර සෑම විටෙක ම පාහේ වරද සම්බන්ධයෙන් තිබෙන සාක්ෂි සොයා බැලී ය. බොරු සාක්ෂි කියන්නා වසලයෙක් බව බුදුන් වහන්සේ දේශනා කර තිබේ. පැරණි ලංකාවේ නෛතික කටයුතු සකස්වීම කෙරෙහි බුදුදහමේ බලපෑම පැවති හෙයින් පැරණි ශ්‍රී ලංකාවේ නෛතික කටයුතුවලදී බොරු සාක්ෂි ඉදිරිපත් කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් විය. නමුත් ඇතැම් රජවරු දඬුවම් දීමට අකමැති වූ අවස්ථා ද පැවතුණි. එනම්, මරණ දණ්ඩනයට නියම වූවන් නිදහස් කළ අවස්ථා සහ අපරාධකරුවන්ට අවවාද දී සුචරිතයට ගැනීමට උත්සාහ ගත් අවස්ථා ලංකා ඉතිහාසයේ දක්නට ලැබේ. විශේෂයෙන් ම රජවරුන්ගේ පෞද්ගලික ජීවිතයේ සුවිශේෂ වූ අවස්ථාවන්හි සිරකරුවන් නිදහස් කරන ලදී. ඇතැම් අවස්ථාවන්හි අපරාධකරුවන්ට දියයුතු දඬුවම් ලිහිල් කළේ ය. රජවරුන් මෙවැනි ක්‍රියා අනුගමනය කිරීමට පෙළඹුණේ බුදුදහමේ ආභාසය නිසා ය.

සතර සංග්‍රහ වස්තුවෙන් ජනතාවට සැලකීම, සතර අගතීන්ගෙන් වෙන් ව දශරාජ ධර්මයෙන් යුක්ත ව රට පාලනය කිරීම වැනි ධාර්මික ක්‍රියාමාර්ග පෙර රජවරු තුළ ඇතිවූයේ ද බුද්ධ ධර්මයේ බලපෑම නිසාවෙනි. සදාචාර සම්පන්න, අපක්ෂපාතී නීති ක්‍රමයක් සකස්වීම කෙරෙහි බුදුදහමේ ආභාසය බෙහෙවින් ම පැවති බව කිව හැකි ය.

**නිගමනය**

සදාචාරවත් සමාජයක් උදෙසා අත්‍යවශ්‍ය වන කරුණු අතුරින් නීතියට හිමිවන්නේ වැදගත් ස්ථානයකි. නීතිය ක්‍රියාවට නැංවීමේදී කවර රටක වුව ඒ සඳහා යම්කිසි බලපෑමක් ඇතිකළ හැකි දෑ පවතී. ඒ අනුව පැරණි ශ්‍රී ලංකාවේ නීති ක්‍රමය සාධාරණ වූවක් වීම කෙරෙහි පෙර සිරිත බෙහෙවින් බලපෑ බවත් එමගින් හැඩගැසුණු අපක්ෂපාතී නෛතික පද්ධතියක සාර්ථකත්වය තහවුරු කරලනු වස් බුදුදහම ඉමහත් බලපෑමක් ඇතිකළ බවත් අවසාන වශයෙන් නිගමනය කළ හැකි ය.

**මුඛ්‍ය පද:** නීතිය, පෙර සිරිත, සදාචාරය, විනිශ්චය

**ආශ්‍රිත ග්‍රන්ථ**

*ඌනපූරණසහිතො මහාවංසො*, (1959). (සංස්.) බුද්ධදත්ත ථෙර, පොල්වත්තේ, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

*දීපවංසය*, (1959). (සංස්.) ඤාණවිමල හිමි, කිරිඇල්ලේ, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

*ධම්පියා අටුවා ගැටපදය*, (1974). (සංස්.) හෙට්ටිආරච්චි, ඩී.ඊ., ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල මුද්‍රණය.

*Epigraphia Zeylanica*, (1964). vol.1. (ed.) S. Paranavithana, Published by the Government of Ceylon.

*Inscriptions of Ceylon,* (2006) vol.1. (ed.) Paranavithana S., Published by the Department of Archeology.